# ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව

(බුලත්සිංහල, පාහියං ලෙන ඇසුරින්)

කේ.එන්. කරුණාතිලක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

kalpaninirukshika8@gmail.com

ප්‍රමුඛ පද: පාහියංගල, ප්‍රාග් ඓතිහාසික, මානවයා, ආහාර රටාව, සත්ත්ව අවශේෂ

## හැඳින්වීම

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල යටගම්පිටිය ග්‍රාමයෙහි පාහියන්ගල පිහිටා ඇත. මෙය දකුණු ආසියාවේ විශාලම ස්වභාවික ලෙනක් ලෙස පෙන්වා දිය හැක. මුහුදු මට්ටමේ සිට අඩි 400ක් පමණ උසකින් පිහිටා ඇත. වසර 47,000ක් තරම් දීර්ඝ යුගයක් නියෝජනය කරන ප්‍රාග් ඓතිහාසික මානවයා මෙම ලෙන ආශ්‍රය කරමින් තම ජීවිකාව ගෙන යාම සඳහා ආහාරයට ගෙන තිබෙන ශාක හා මාංෂ ජනක ආහාර පිළිබඳ අධ්‍යයනය සිදු කරන ලදි.

මේ පිළිබඳ සාධක මතුපිට සිට සෙ.මී 220 ක් තරම් ගැඹුරින් පවා සාධක ලැබී ඇත. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ කටුස්සාගේ සිට විවිධ ප්‍රමාණයේ විශාල සතුන් දක්වා ආහාරයට ගෙන ඇත. තෙත් කලාපික දේශගුණයක් සහිත පාහියංගල අවට ස්වභාවික පරිසරයේ සැරිසරන ලද සතුන් මොහුන්ගේ ආහාරය වූ අතර දඩයම ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය විය. විවිධ සතුන්ට අයත් අස්ථි සාධක වලට අනුව ක්‍ෂීරපායි සතුන් , පක්‍ෂීන් උරග වර්ගයේ සතුන් මෙන්ම ගොළුබෙල්ලන් වැනි සතුන්ගේ සාධක බොහොමයක් ඇත. මෙම සියලුම සතුන්ගේ අස්ථි කොටස් ඉතා කුඩා කොටස් වලින් හා පිළිස්සුම් සහිතව ලැබී ඇත. එයින් පෙනීයන්නේ මස් පුළුස්සා ආහාරයට ගත් අතර අස්ථි කොටස්වල ඇතුළත පවතින ඇට මිදුලු ආහාරයට ගැනීම සඳහා ගල්වලින් තලා ඇති බවයි. සමහර අස්ථි කොටස්වල තියුණු කැපුම් සළකුණු ද තිබූ අවස්ථා බොහොමයක් විය.

## ක්‍රමවේදය

ක්ෂේත්‍රයට පිවිසීමට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මධ්‍ය ශිලා යුගයේ මානවයාගේ ආහාර රටාව සම්බන්ධයෙන් පහතරට තෙත් කලාපයේ ලෙන් ආශ්‍රිතව කැනීම් සිදුකර හඳුනාගෙන ඇති තොරතුරු අධ්‍යයනය කරන ලදි. අධ්‍යයනයට බඳුන් කරගත් බුලත්සිංහල පාහියන් ලෙන ආශිතව සිදුකර ඇති කැනීම් වාර්තා පරීක්ෂා කිරීමෙන් අනතුරුව ක්‍ෂේත්‍ර ගවේෂනයක් සිදුකරන ලදි. ස්ථරවිද්‍යානුකූල කැනීම් මගින් හදුනාගෙන ඇති ශාකමය ආහාර සඳහා භාවිතා කර ඇති ශාක පරිසරයේ තිබේද යන්න පරීක්ෂා කිරීමයි.

වර්ගීකරණය 01 -ශාකමය ආහාර

02- සත්ත්ව ආහාර (ක්ෂිරපායින්, පක්ෂීන්, මත්ස්‍යයින් , බෙල්ලන්)

මධ්‍යශිලා යුගයේ වෙනත් ගුහා වාසස්ථාන ආශ්‍රයෙන් හඳුනාගෙන ඇති මානවයාගේ ආහාර රටාව ගැන (බටදොඹලෙන, අලවලලෙන)

අධ්‍යයනයට බඳුන් කරණ ලද පාහියන් ලෙනේ ආහාර රටාව සම්බන්ධයෙන් හඳුනාගත් තොරතුරු සමඟ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ ශාකමය ආහාර සඳහා ද වැදගත්කමක් ලැබී ඇත. විශේෂයෙන් ස්ත්‍රී පක්ෂය මෙවැනි ශාකමය ආහාර රැස්කරන්නට ඇතැයි සිතිය හැකිය. ඒ අතරින් කටු අල, ගෝනල වැනි ආහාරයට ගත හැකි අල වර්ග වල් කෙසෙල් , දික් කුකුණ වැනි වෙනත් ශාකමය ද්‍රව්‍ය ආහාරයට ගෙන ඇත. කැකුණ ඇට පුළුස්සා කෑ බවට සාධක සෑම ස්ථරයකින්ම ලැබේ. එසේම පාහියංලෙන අවට අදටත් පවතින වල් කෙසෙල් සාධකවලට අනුව අතීත මානවයා වල් කෙසෙල් එනම් ඇටි කෙසෙල් ද ආහාරයට ගෙන ඇත. තමා ජීවත් වන අවට පරිසරයේ පවතින ශාකමය ද්‍රව්‍ය තම ආහාරය සඳහා එක්රැස් කිරීමේ ක්‍රමවේදය යටතේ පරිසරයෙන් සපයා ගැනීම සිදුකරනු ලැබුවා මිස එම ආහාර ද්‍රව්‍ය වගා කිරීමේ ක්‍රම දැන සිටියේ නැත. ඔවුන් ගත කළ සංචාරක ජීවිතය තුළ තමා සිටින පරිසරයේ ආහාර හිඟ වූ විට වෙනත් කලාපයෙන් ආහාර හුවමාරු කරගෙන ඇත.

පාහියන්ගල විසූ මානවයා මුහුදු බඩ ප්‍රදේශවල සිටි මුහුදු බෙල්ලන් , මිරිදිය බෙල්ලන් හා අකාවුස් වර්ගයේ ගස් බෙල්ලන් ආහාරයට ගෙන ඇත. විශේෂයෙන් මුහුදු බෙලිකටු ලැබී තිබෙන නිසා මෙහි විසූ මානවයා මුහුද සමඟ ද යම් යම් ගණුදෙනු කර ඇත. නිමල් පෙරේරා කියා සිටියේ බෙල්ලන්ගේ කවච අතර ලුණු බෙල්ලන්ගේ කවච පවා දක්නට ලැබුණු බවයි. ලුණු බෙල්ලන් මේ අතර සිටීමෙන් පාහියන්ගල ලෙනේ විසූ ආදි මානවයන් ලුණු රස හඳුනන මානවයකු බව ද ඇතැම් විට පිළිස්සූ මස් ලුණු සමඟ මිශ්‍ර කරන්නට ඇති බවට ද ඔහු සැක පහළ කළේය.

පාහියංගල ලෙනේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාවේ මාංශ ආහාර ප්‍රධාන තැනක් ගනී. ඊට අනුව රිලවා හා වඳුරා වැඩි වශයෙන් ආහාරයට ගත් බවට ලැබී ඇති දත් හා අස්ථි කොටස් සාක්ෂි දරයි. ඊට අනුව පහතරට තෙත් කලාපීය වනාන්තරවල රිලවා හා වඳුරා අතීතයේ බහුල ලෙස ජීවත්වන්නට ඇත. විශේෂයෙන් මෙම ප්‍රදේශයේ කළු වඳුරා ව්‍යාප්ත වී ඇත. මොවුන්ගේ ආහාර රටාවේ වලිකුකුළා , හම්බාවා , හෝතම්බුවා, ඉත්තෑවා, දඬුලේනා, තලගොයා, කබරා වැනි සතුන් මෙන්ම සර්ප විශේෂ ද බහුලව හමුවේ. කිඹුලා ආහාරයට ගත් බවට සාධක ලෙස කිඹුල් දත් පාහියංගල ලෙනෙන් ලැබී ඇත. මිරිදිය මසුන් ආහාරයට ගත් බවට සාධක පාහියංගල ලෙනෙන් ලැබී ඇත. ඊට අනුව විශාල ප්‍රමාණයේ "ලෙහෙල්ලා" නම් මසුන් ආහාරයට ගෙන ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාණ සත්ව අවශේෂ විශ්ලේෂක ජූඩ් පෙරේරා මෙම ලෙහෙල්ලා කිලෝග්‍රෑම් 10, 15 ප්‍රමාණයෙන් යුක්තව සිට ඇති බව හමුවන දත් පරීක්ෂා කරමින් පවසා ඇත. වර්තමානයේ එතරම් විශාල මසුන් දැකිය නොහැකි අතර මෙම මසුන් වර්ගය වඳ වී යාමට ආසන්න බව කිව යුතුය. පාහියන්ගල ලෙනෙන් විශාල සතුන්ගේද අස්ථි හමු වී ඇත. පර්යේෂණවලින් ලැබුණු විශේෂ සාධකයක් නම් රයිනෝසිරස්ට අයත් දතක් හමු වීමයි. රයිනෝසිරස් නම් සත්ව වර්ගය දැනට ලංකාවෙන් හමු නොවේ. නමුත් රයිනෝසිරස්ට අයත් දත් මීට පෙර ද පහත රට තෙත් කලාපයේ රත්නපුර දියළු පස් නිධි ආශ්‍රයෙන් සොයාගෙන ඇත. (දැරණියගල 1958) මෙම කලාපයටම ආසන්නම පාහියංගල පිහිටා ඇති නිසාත් මෙම කලාපයේ ද අතීතයේ රයිනෝසිරස්

ජීවත්වන්නට ඇත. ඊට අනුව පාහියංගල ලෙනේ කැනීම් වලින් රයිනෝ දත් ලැබෙන නිසා ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාරය සඳහා රයිනෝවන් ද දඩයම් කරන්නට ඇතැයි සිතිය හැකිය. මෙම කලාපයටම අයත් බටදොඹ ලෙනේ කරන ලද පර්යේෂණ වලදී හිපපොටේමස් නම් සත්වයාගේ සාධක ද ලැබී ඇත. දැනට අප්‍රිකා මහාද්වීපයට පමණක් සීමා වී ඇති වඳ වී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති හිපපොටේමස් මෙන්ම රයිනෝසිරස් ද අතීතයේ ලංකාවේ මඩවගුරු ආශ්‍රිත සිටි බවට තොරතුරු ලැබේ. සෙනරත් දිසානායක ප්‍රකාශ කරන්නේ අතීත මානවයා ආහාරයට ගත් සතුන් 800කගේ පමණ අවශේෂ හමු වූ බවත් කටුස්සාගේ, අලි පැටවකුගේ දතක් ද බංගලාදේශ ව්‍යාඝ්‍රයකුගේ අස්ථි කොටසක්ද රයිනෝසිරස්ගේ ඇඟිල්ලක කොටසක් ද වන බව ප්‍රකාශ කරයි.

### ආශ්‍රිත ග්‍රන්ථ


පාහියන්ගල, චන්දිම හිමි (2010) ***මී මුත්තාගේ නිවහනට ගොඩ වැදෙමු***, රුවන් ප්‍රකාශකයෝ, බුලත්සිංහල.